# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,675 - 2010 ඔක්තෝබර් මස 08 වැනි සිකුරාදා - 2010.10.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1732 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1732 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1734 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ඔක්තෝබර් මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 සැප්තැම්බර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1731- B 80159—3,350 (2010/10)
A1–

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2010 අංක 140

D/AF/747.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2010 දෙසැම්බර් මස 31 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරීයා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :

විං කමාන්ඩර් රොෂාන් අරුල්කුමාර් ජේකොබ් (01625) - පරිපාලන

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

10-415

2010 අංක 141

D/AF/751.

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද නිත්‍ය ගුවන් හමුදාවට මාරු කිරීම

2009 අගෝස්තු මස 31 වැනි දින සිට පහත නම සඳහන් ස්වේච්ඡා නිලධාරීයා ස්වේච්ඡා ගුවන් හමුදා සේවයේ සිට නිත්‍ය ගුවන් හමුදා සේවයට මාරු කරන ලදී :

විං කමාන්ඩර් කැලිස්ටස් රෝහිත ඩයස් ගුණවර්ධන (02792) - පරිපාලන/රෙජිමේන්තු

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2010 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.

10-416

# රජයේ නිවේදන

**සබරගමු මහ සමන් දේවාලයීය ඇසළ උත්සවය - 2010**

262 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනත යටතේ පළකර ඇති අංක 1563 2008.08.15 වැනි දින ගැසට් පත්‍රය ප්‍රකාරව හා 1992 අංක 58 දරන බලතල පැවරීම් (ප්‍රාදේශීය ලේකම් වරුන්) පනත අනුව රත්නපුර ප්‍රාදේශීය ලේකම් චිත්‍රා මානෙල් කෝට්ටවත්ත වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2010 සබරගමුව මහ සමන් දේවාලයේ ඇසළ උත්සව කඳවුර සම්බන්ධයෙන් පහත සඳහන් නියෝග පවරමි.

01. මෙවර සබරගමු මහ සමන් දේවලයීය ඇසළ උත්සවය 2010 වර්ෂයේ සැප්තැම්බර් මස 09 වැනි දින ආරම්භ වී සැප්තැම්බර් මස 24 වැනි දින දිය කැපීමෙන් පසු අවසන් වන බව දැනුම් දෙමි.

02. උතුරට වැසියන් පදිංචි පරවේනි නිල කරුවන්ගේ ඉඩම් රථගාල සහ සල්පිල භූමිය පෙන්වන සිමෙන්ති කණුව හා රථගාලට ඇතුළු වන පාර ද, දකුණට : තෙන්නගේ වත්ත හා කළුගග ද, නැගෙනහිරට : රත්නපුර පානදුර ප්‍රධාන මාර්ගය ද, බස්නාහිරට : දේවාලය සතු මහ උයන්වත්ත යන සීමාවන්ට මැදිව පිහිටි භූමි භාගය ඇසළ උත්සවය පවත්වන භූමි භාගය වේ. රත්නපු පානදුර ප්‍රධාන මාර්ගයේ ප්‍රධාන වාහල්කඩේ සිට කොටාඹේ දක්වා ගමන් කර එතන සිට මාර්ගය ඔස්සේ කළුගග දක්වා හා කළුගග ඔස්සේ රත්මල් ඇල්ල දක්වා ගමන් කර එම ස්ථානයේ දී දිය කපා ආපසු එම මාර්ගය ඔස්සේ නැවත මහ සමන් දේවාලය දක්වා පැමිණීම දිය කැපීමේ පෙරහැරේ ගමන් මාර්ගය වේ.

03. දේවල භූමිය වැලිමළුව හුණුවන වීදිය හා කුරුවිට ගම්පහේ වීදියට මැදිව පිහිටි භූමි භාගය හා වීදිය අවට භූමිය තුළ ආහාර පිසීම තහනම් කරමි.

04. පෙරහැර දින පහ සඳහා සල්පිල් භූමියේ පිහිටි ස්ථිර මල්කඩ හය තාවකාලික වෙළඳසැල් හා සල්පිල් භූමිය තාවකාලික වෙළඳ සැල් 200ක් සඳහා මා විසින් වෙන්දේසි කර අවසරය ලබා දෙන බව දන්වමි. මෙම වෙළඳසැල්හි මල්, හඳුන්කූරු, ඉටිපන්දම්, කපුරු, භාර ඔප්පු කිරීම සඳහා අවශ්‍ය රූප, රසකැවිලි හා විසිතුරු භාණ්ඩ විකිණීම සඳහා අවසරය දෙමි.

05. අංක 4හි සඳහන් සල්පිල් භූමියෙහි හැර උත්සව භූමිය ඇතුළත අන් කිසිම ස්ථානයක වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

06. රථගාල පරිශ්‍රයෙහි හැර උත්සව භූමිය ඇතුළත අන් කිසිදු ස්ථානයක පුද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුලුව සියලුම රථවාහන මගින් හෝ කඳවුරු භාර නිලධාරී තැනගේ අවසර පත්‍රයක් නොමැතිව උත්සව භූමියට ඇතුල් කිරීම තහනම් කරමි.

07. රත්නපුර පානදුර ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදිකර ඇති ප්‍රධාන වාහල් කඩ තුළින් දේවාල පූජා භූමියට වාහන ඇතුල් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

08. මා විසින් කඳවුරු භූමිය තුළ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් වෙන්දේසි කරන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

09. වෙන්දේසි කරන ලද වෙළඳ බිම් වල ඉදි කරනු ලබන තාවකාලික ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට අනුකූල විය යුතුය. බිම් කොටස් ලබා ගන්නා වෙළෙන්දන් විසින් ඇසළ උත්සවයෙන් පසු තමාගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතීන් ඇතුළු සියළුම අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂ මහතුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතුය.

10. මගෙන් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිම ගොඩනැගිල්ලක් ඉදි කිරීම තහනම් කරමි.

15 වැනි ව්‍යවස්ථාව

(අ) කිසිවකු විසින් ප්‍රාදේශීය ලේකම් තැනගේ අවසර ලබාගෙන මිස වීදියක් වශයෙන් පාවිච්චි කරන්නා වූ හෝ වෙන් කර ගන්නා වූ හෝ උත්සව භූමිය තුළ වෙනයම් භූමි කොටසක් හෝ ඇසුරු කරගෙන මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ විශාල කිරීම නොකළ යුතුය

(ආ) ප්‍රාදේශීය ලේකම්ගේ හෝ බලයලත් නිලධාරීන්ගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තකු විසින් උත්සව භූමිය තුළ ටිකට් පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාරනයක් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතුය.

(ඇ) සමන් දේවාල පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාල සීමාව තුළ දුම්කොළ, ආශ්‍රිත නිෂ්පාදන විකිණීම සහ භාවිතා කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

සි. එම්. කෝට්ටවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

10-414

---

**උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත**

05 වැනි වගන්තිය යටතේ නිවේදනය

110 වැනි අධිකාරය වූ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 5 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම 1935 සැප්තැම්බර් මස 20 වැනි දින අංක 8146 *ගැසට් පත්‍රයේ* අතිරේකයෙහි පළ කරනු ලැබූ නිවේදනයේ සබරගමුව පළාත, කෑගල්ල දිස්ත්‍රික්කය යන ශීර්ෂය යටතේ,

* *යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇතුළත :*

උඩුව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයට අදාළ වන අංක 28 දරන විෂය වෙනුවට හා ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළ වන අංක 20 දරන විෂයට ඉක්බිතිව මෙහි සඳහන් "අ" උපලේඛනය දැක්වෙන අලුත් විෂය ඇතුළත් කිරීමෙන්,

* *එසේම ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇතුළත :*

කඳුපිටපත්තුව දකුණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් කොට්ඨාශය අදාළ වන අංක 21 විෂය වෙනුවට මෙහි සඳහන් "ආ" දරන උපලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන් ද,

2010.08.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනය සංශෝධනය කරමි.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2010 අගෝස්තු මස 27 වැනි දින කොළඹ දී.

**කෑගල්ල දිස්ත්‍රික්කය**

***බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය***

"අ" උපලේඛනය

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත කඳුපිටපත්තුව දකුණ (නැගෙනහිර) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය :

01. අක්කර 17 ජනපදය/ කබගමුව/ ලබුකොහුමුල්ල/යටිදැරියවත්ත කොටසක්
02. හිග්ගොඩ/තුම්මුදුන
03. එලගල්ල/හුණුගල වත්ත කොටසක්/කනන්ගමුව
04. අක්කර 76 ජනපදය/චන්ද්‍රිකාපුර/පුස්පනේ/උඩගොඩ ජනපදය/විලුඹහේන/යටිදැරියවත්ත කොටසක්
05. ගැටියමුල්ල/මීනිමාරුව/පන්නල/යටිදැරියවත්ත කොටසක්
06. අලවතුර/ගනේගොඩ/කැන්දවවත්ත/මාරන්විලවත්ත කොටසක්/ මොරගහලන්ද/පිට්ටෑගම
07. අඹුවක්ක/අඹුවක්ක ජනපදය /බඹරගල/ කන්නන්ගරපුරගම/ යටපාන
08. පනාගොඩ/තෙල්කුමුදුවල/තෙල්හිටියාව
09. අම්පාගල/දෙහිගම්පල/කිරිපෝරුවවත්ත කොටසක් (පාරාවත්ත)/ නාගොල්ල වත්ත පාරාවත්ත කොටස/ පන්නල/ උල්වල
10. කිරිපෝරුව/කිරිපෝරුව වත්ත
11. ආඩ්‍රෝස් වත්ත/හපුගම්මන/කැළණි වත්ත කොටසක්/පනාපිටිය
12. එරබුදුවල/හල්ඹලුව/කුඩුමීරිය ජනපදය/පාරාවත්ත කොටසක්
13. ඇදුරාපොලවත්ත කොටසක්/පුනහැල
14. කැන්දව/කැන්දවවත්ත/තුම්බාගේ/තුම්බාගේ ජනපදය
15. කරදවත්ත/ලෑවල ජනපදය/මානංගල වත්ත/ඔරුබැද්ද/පුනහැල කොටසක්/පුස්සහේන ජනපදය/වෑගොල්ල වත්ත
16. වෑගල්ල/වැලිකන්ද/වැලිතුඩුව
17. අප්මීර් වත්ත/කඳුසිටගම/නාරංගල/උඩදුල්ගල /වරකාහේන
18. අඹමල්ල/ඇදුරාපොල වත්ත දකුණු කොටස (අඹමල්ලවත්ත) ඇදුරාපොල
19. ගලහැල්ල/කලුපහනවත්ත/සිවගිරිවත්ත/උඩපොත
20. මහරංගල්ල/පීලවල/යටිදැරියවත්ත කොටසක්
21. ඇදුරාපොලවත්ත කොටසක්/කුඩාදෙනිය/ලෑවල/ලෑවලවත්ත/ යත්ඇල්ල
22. අටගුන්න/බුලත්කොහුපිටිය/නෙවුස්මියර් පහල ජනපදය/වියලි පිටිය
23. ඌරුමීවල/ඌරුමීවල ජනපදය/ඌරුමීවල වත්ත
24. දියහිටියාවල/නෙවුස්මියර් ඉහල ජනපදය/ පැනැම්ගම/සේනපුර/ සූරිය මල්ගම/ වහරකවත්ත/ යටිදැරිය/ යටිදැරියවත්ත කොටසක්
25. ඉහල උඩුව/කැකුලපාන/වහරකවත්ත/උඩුව/උනන්කන්ද වත්ත කොටසක්

26. දේදුගල වත්ත/නාංගල/නෙලුවක්කන/නැවිලන්ඩ් වත්ත/ නිර්මලාවත්ත
27. හිල්රෝස් වත්ත/කැන්දල් ඔය වත්ත/ පැලැම්පිටිය/වින්සන්ට් ෆොරස්ට් වත්ත
28. දේදුගල/ගලවැරලිය වත්ත කොටසක්/කැල්වින් ජනපදය

### කෑගල්ල දිස්ත්‍රික්කය

*බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*

"ආ" උපලේඛනය

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත කදුපිටපත්තුව දකුණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය

01. අරුක්මුල්ල/හිග්ගොඩවත්ත/හුණුගල වත්ත කොටසක්/ ලාහුපතේ/තැඹිලිපිටිය
02. මල්වාන උතුර/පින්දෙනිය වත්ත කොටසක්/පොතුකොලදෙනිය
03. හපුදෙනිය/හීන්වැල්ල/මල්වාන දකුණ
04. අරුක්ගම්මන ඉහලගම/අරුක්ගම්මන පහලගම
05. අබසිංකන්ද/ගොඩගම්ගස්තැන්න/හත්නාපිටිය ජනපදය/ කරගල/පාරාවත්ත කොටසක්
06. අම්පෙ දකුණ/හත්නාපිටිය/මුස්ලිම්ගම/පාරාවත්ත කොටසක්/ පට්ටියමුල්ල
07. අම්පේ මුස්ලිම්ගම/අම්පේ සිංහලගම/අම්පේ වත්ත/ ඩිමෙල්ගොල්ල වත්ත /කොටියාකුඹුර ජනපදය
08. බෝඅත්ත/දෙමටගොල්ල/ගලඋඩහේන ජනපදවය/ හැඩුමකන්ද/ රුක්ගහතැන්න
09. කුරුණෑගොඩ මුස්ලිම් ගම/කුරුණෑගොඩ සමනල ගම
10. අටාල/අටාලවත්ත කොටසක්/පින්දෙනියවත්ත/සල්ගමවත්ත
11. හරිගල/ඉද්දමල්පාන/කිනිගම
12. අරන්දර/හල්ලව ජනපදය/මයිලන්ඩ් වත්ත
13. ඇපලකොටුව/කිරිදන
14. බටුපිටිය/පින්දෙනිය
15. බෝගහපිටිය/මාබොඩවත්ත/නාරංවත්ත
16. බෝයගොඩ/බෝයගොඩවත්ත/දික්හේනවත්ත
17. ඇගල්කන්ද/කනටුවාවල/මාබඩ/මාබඩවත්ත කොටසක්

10-245

---

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/6/40.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වැනි, 27 වැනි සහ 33 වැනි වගන්ති යටතේ සාදන ලද 1980 අංක 1 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6), (අ) (ආ), (ඇ), (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය කුඹුගොඩආර, ශ්‍රී රතනාරාම විහාරස්ථානයේ පිහිටි ර/සිරි රතන මූලික පිරිවෙන 2009.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය රම්මලේ සිරි රතන ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 1 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළ වී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුනිල් එස්. සිරිසේන,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2010 සැප්තැම්බර් මස 16 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, ඉසුරුපාය
අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

10-382

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංකය : 262369.
කල්‍යාණි පෙරේරා විජේසිංහ ගුණතිලක සහ ශ්‍රීනාත් රවිරත්න මුණසිංහ.

2010 පෙබරවාරි මස 24 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. සී. පී. ගනේපොල විසින් 2005 ඔක්තෝබර් මස 07 වැනි දින සහතික කරන ලද අංක 10030 දරන දැන් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වන ලබන කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කල්‍යාණි පෙරේරා විජේසිංහ ගුණතිලක සහ ශ්‍රීනාත් රවිරත්න මුණසිංහ නයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන් එකක් සහ දෙලක්ෂ විසිතුන්දාස් තුන්සිය අනූවයි ශත විසි එකක (රු. 12,23,390.21) මුදලක් 2009 සැප්තැම්බර් මස 24 වැනි දින වන විට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන එකක් සහ දෙලක්ෂ විසිතුන්දාස් තුන්සිය අනූවයි ශත විසි එකක මුදල (රු. 12,23,390.21) අයකර ගැනීම සඳහා 2009 සැප්තැම්බර් මස 25 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 10,17,019.78ක මුදල මත 14%ක වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩකොට එකී අංක 10030 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩොෆ් වීදියේ අංක 99හි අනුඥලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දර බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනුන ලබයි.

#### උපලේඛනය

බලයලත් මිනින්දෝරු එස්.ඩබ්. මාකලන්ද විසින් 1970 මාර්තු මස 23 වැනි දින සාදන ලද පිඹුරු අංක 323හි දැක්වෙන බස්නාහිර පළාතේ,

කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, (කොළඹ ලියාපදිංචි කොට්ඨාසය තුළ) අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ සිංහාරමුල්ලේ කැළණිසිරි මාවතේ වරිපනම් අංක 36/5 දරන මකුළුගහවත්ත කියන ඉඩමේ ගහකොල, වගාවත්. ගොඩනැගිලි සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කර ලොට් 04 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේම ලොට් 03 කොටස ද. නැගෙහිරට : ලොට් 39 (අඩි විස්සක් පළල පාර සඳහා වෙන් කරය) ද, දකුණට : ඉහත කී පිඹුරේ ලොට් 05 කොටස ද, බස්නාහිරට : කැළණිය නගර සභාවට අයිති ඉඩම ද යන මායිම් තුළ පෙර කී පිඹුරු අංක 323ට අනුව පර්චස් දහ අටක් විශාල ඉඩම (අ. 0, රූ. 0, පර්. 18) කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C387/129 වෙළුම/පත්‍රුරුව යටතේ ලියාපදිංචි කර ඇත.

පිඹුරු අංක 323හි මාර්ග වෙන්කරයන් ලෙස සලකුණු කර ඇති ලොට් 37, 38 සහ 39 යන ඉඩම් කැබලි හරහා මාර්ග අයිතිය ද ඇතුළුවයි.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

10-372

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2008.10.16 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

01. මහජන නොතාරිස් එම්. එම්. ඉක්බාල් විසින් සහතික කරන ලද 2001.08.07 දිනැති අංක 18665 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2008.09.05 දින තෙක් පොළිය වශයෙන් රුපියල් පන්ලක්ෂ විසිඅට දහස් තුන්සිය අනූහතයි ශත හතළිස් අටක (රු. 5,28,397.48) මුදල සමග රුපියල් දෙලක්ෂ අනූදහස් නවසිය විසිදෙකයි ශත විසිපහක (රු. 2,90,922.25) මුදලක් මත වසරකට සියයට දාසයයි දශම අටය අට (16.88%) බැගින් පොළියක් ද, 2008.09.06 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කටාන, කටාන නැගෙනහිර, අංක 39, ලංකා මාතා පාර හි පදිංචි වරාපිටිය ආචාරිගේ නිහාල් ගාමිණී මහතාගෙන් අයවිය යුතුව ඇත.

02. එකී අංක 18665 දරන බැඳුම්කරය මත අයවිය යුතු ඉහත 1හි සඳහන් මුදල සමග විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද. ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු සහ මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට හලාවත, රදගුරු මාවත, අංක 4ඩී හි පදිංචි වෙන්දේසිකාර බී. එල්. ජේ. නිශ්ශංක මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ, අලුත්කුරු කෝරළයේ, දූනගහපත්තුවේ, කලුවරිප්පුව නැගෙනහිර හි පිහිටි වවුල්හොරේවත්ත හෙවත් දවටගහවත්ත යනුවෙන් හඳුන්වන හා නමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඩී. ප්‍රසාද් විමලසේන විසින් සාදන ලද 1996.04.07 දිනැති අංක 2066 දරන පිඹුරේ ලොට් අංක 2 වශයෙන් විස්තර කර ඇති ඉඩම් කැබැල්ලේ මායිම් වන උතුරට : පාර ද (R. D. A. ), නැගෙනහිරට : ඩබ්. ඒ. තෝමස් අප්පුහාමිගේ ඉඩම ද, දකුණට : එස්. ජෝකීනු සිල්වාගේ කුඹුර ද, බස්නාහිරට : ලොට් අංක 01 ද මායිම් රූඩ් එකයි පර්චස් හයයි දශම දෙකක (අ. 0, රූ. 1, පර්. 6.2) බිම් ප්‍රමාණය සමග මෙම සීමාව තුළ අඩංගු සියලු දේද වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 758/124හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ඩී. ගෝමස් මහතා,
කළමනාකරු.

10-402

---

### කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංක පීකිව් 116 දරන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය

ණය ගිණුම් අංකය : 236443.
කළුදේව සුජාතා ප්‍රියානි මෙන්ඩිස්
අගම්පොඩි වර්නන් ප්‍රේමචන්ද්‍ර මෙන්ඩිස් ගුණසේකර.

කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ජූනි මස 18 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරන ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. විජේනාරායන විසින් කලින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් සහ වර්තමානයේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 1033 සහ 2005 අප්‍රේල් මස 29 වැනි දරන බැඳුම්කරය සහ අංක 1057 සහ 2005 මැයි 17 වැනි දින දරන බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් එහි බන්ධනදායින් වන කළුදේවගේ සුජාතා ප්‍රියානි මෙන්ඩිස් සහ අගම්පොඩි වර්ණන් ප්‍රේමචන්ද්‍ර මෙන්ඩිස් ගුණසේකර සහ උකස්කරු වශයෙන් අගම්පොඩි වර්නන් ප්‍රේමචන්ද්‍ර මෙන්ඩිස් ගුණසේකර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, ඒ අනුව ඉහත කී බැඳුම්කරමත 2010 අප්‍රේල් මස 30 වැනි දිනට රුපියල් විසිනවලක්ෂ විසිනවදහස් එකසිය දහඅටකුත් ශත හතළිස් නවයක් (රු. 29,29,118.49) මුදලක් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත වර්තමානයේ දී ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද, ඉහත කී රුපියල් විසිනවලක්ෂ විසිනවදහස් එකසිය දහඅටකුත් ශත හතළිස් නවයක (රු. 29,29,118.49) මුදල මත සහ 2010 මැයි 01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් විසිහතරලක්ෂ හාරදහස් එකසිය තිස්හතරකුත් ශත පනස්හයක් (රු. 24,04,134.56) වර්ෂයකට 14% බැගින් පොළිය ද, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති යම් වෙනත් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1033 සහ 1057 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, අළුත් කඩේ

විදියේ, අංක 99 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු වන එල්. බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

(1) දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, දකුණු වෙලබඩපත්තුවේ, බටපොල ගමේ පිහිටි කැටපොලමූකලාන සහ මානාන (ටී. පී. 259860) නමැති ඉඩමේ ලොට් 01හි අනු බෙදීමක් වන ලොට් 22 නමැති බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේම ලොට් 12 ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් 13 (අඩි 20ක් පළල පාර) ද, දකුණට : මෙම ඉඩමේම ලොට් 26 සහ 27 ද, බස්නාහිරට මෙම ඉඩමේම ලොට් 23 ද යන මායිම් තුළ පිහිටි මොරොන්තුඩුව බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. එස්. සී. විතාන විසින් මැන සදාන ලද අංක 1057 සහ 2001 ඔක්තෝබර් මස 23 වැනි දරන පිඹුරේ නිරූපිත පරිදි පර්චස් විසිඅටක් (අ. 0. රූ. 0, පර්. 28) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි පස, ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය. මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී753/204 යටතේ ලියාපදිංචි කර ඇත.

(2) ඉහත සඳහන් බටපොල ගමේ පිහිටි කැටපොලමූකලාන සහ මානාන (ටී. පී. 259860) නමැති ඉඩමේ ලොට් 01හි අනු බෙදීමක් වන ලොට් 12 නමැති බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේම ලොට් 10 ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් 13, අඩි 20ක් පළල පාර ද, දකුණට : මෙම ඉඩමේම ලොට් 22 ද, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 11 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1057 දරන පිඹුරේ නිරූපිත පරිදි පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) නොහොත් හෙක්ටයාර් 0.0253ක් විශාල බිම් කැබැල්ල සහ ඒ හත පිහිටි පස, ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය. මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලායේ සී753/205 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද ඉහත කී ඉඩමට ඉහත කී අංක 1057 දරන පිඹුරේ නිරූපිත ලොට් 13 මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ වෙනත් පරවශතා අයිතිවාසිකම් ද සමග ය.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

10-371

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංක : එම්ජී/6/429/එම්ජී1/303.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.15 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

හොරණ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එච්. ඩබ්. ජයන්ත විසින් සහතික කරන ලද 2006.05.03 දින හා අංක 7573 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, පෝරුවදණ්ඩ පදිංචි බමුණුගේ මිහාල් රත්නායක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.06.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ තිස්එක් දහස් අටසිය හැට අටයි ශත හැට එකක (රු. 4,31,868.61) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 7573 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් දෙසිය දහයයි ශත එක (රු. 210.01) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙ හි බලයලත් වෙන්දේසිකාර එච්. ජී. පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, උඩුගහපත්තුවේ, රයිගම් කෝරළයේ, රත්මල්ගොඩ ග්‍රාමයේ පිහිටි රත්මල්ගොඩ එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩී. ගුණසේකර විසින් සකසන ලද 2006.01.26 දිනැති හා අංක 1876 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 2 ලෙස දක්වා ඇති (මෙය බලයලත් මිනින්දෝරු එස්. ඩී. සරත්චන්ද්‍ර විසින් සකසන ලද 1998.01.24 දිනැති හා අංක 1088 දරන පිඹුරේ කැබලි අංක 2හි නැවත මැනුමකි) ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 32.20 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස හා ඒ මත පිහිටි ගහකොළ, ඇතුළු සියලු දේත් සමග වේ.

මෙය මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 103/40 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
වැඩබලන සාමාන්‍යාධිකාරී.

2010 සැප්තැම්බර් මස 23 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

10-341/7

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංක : 2/76734/එක්ස්2/129.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.24 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. රුහුණුහේවා විසින් සහතික කරන ලද 2006.08.19 දින හා අංක 2964 දරන උකස් බැඳුම්කරය මත අයවිය

යුතු මුදල් ගෙවීම, කටාන පදිංචි දෙගම්බඩ අප්පුහාමිලාගේ දෝන ශ්‍යාමලී ප්‍රේමතිලක හෙවත් ශ්‍යාමලී ප්‍රේමතිලක සහ දෙගම්බඩ අප්පුහාමිලාගේ දොන් ප්‍රේමලාල් සහ එදිරිසිංහ ආරච්චිගේ සංජීව නලීන් හෙවත් සංජීව නලීන් එදිරිසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.03.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ දාහතර දහස් එකසියයයි ශත විසිතුනක (රු. 4,14,100.23) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2964 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හැත්තෑ අටයි ශත හැට නවය (රු. 178.69) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න).

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, බෙල්මන්ට් වීදිය, 2 වැනි මහල, අංක 53හි බලයලත් වෙන්දේසිකාර කේ. පී. එන්. සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කොට්ඨාසය තුළ දූනගහපත්තුවේ, අලුත්කුරු කෝරළයේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ කටාන බටහිර ග්‍රාමයේ පිහිටි මහහොරේවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක විසින් සකසන ලද 1999.06.22 දිනැති හා අංක 7893 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10.10ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස හා ඒ මත පිහිටි ගහකොළ, ඇතුළු සියලු දේත් සමග වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 836/172 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද එකී 7893 පිඹුරේ දක්වා ඇති අඩි 12ක් පළල පාර සඳහා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්. එම්. දයාසිංහ,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 සැප්තැම්බර් මස 23 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

10-341/5

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.01 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් බී. ආර්. එම්. එස්. රත්නායක විසින් සහතික කරන ලද 2007.07.18 දින හා අංක 27 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කිරිදිවැල පදිංචි කුමාරගේ අතුල ප්‍රියදර්ශන නොහොත් අතුල ප්‍රියදර්ශන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.02.26 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හයලක්ෂ දහතුන් දහස් හයසිය හැට එකයි ශත විසිහතරක (රු. 6,13,661.24) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 27 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් තුන්සිය තිස් හයයි ශත විසිපහ (රු. 336.25) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මීගමුව, ප්‍රනාන්දු පටුමග, අංක 22හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ ගඟබඩ පත්තුවේ, මහලොලුව පිහිටි බෙලිගොල්ල එස්ටේට් නමැති ඉඩමට 1988.03.03 දින බලයලත් මිනින්දෝරු ජී. ජයකොඩි විසින් මැන සකසන ලද අංක 2021 දරන පිඹුරේ කැබලි අංක 119 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 18ක් වූ බිම් කොටස සමග සියලු දේත් සමග වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 299/286 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස අංක 2021 දරන පිඹුරේ කැබලි අංක 13ඊ සහ 13 සමග මාර්ග අයිතිය ද වේ.

ඩබ්. එම්. දයාසිංහ,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 සැප්තැම්බර් මස 23 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

10-341/4

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : ජීපී/02/3834/එක්ස්2/479.

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : එම්ජී6/763/එම්ජී1/548.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.15 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ටී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද 2008.05.07 දින හා අංක 1720 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, පානදුර පදිංචි ගුණවර්ධන මහවඩුගේ කුසල් නයනී විජේසූරිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.06.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ හතලිස් පන්දහස් හතලිස් හතයි ශත එකොළහක (රු. 3,45,047.11) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1720 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය තිස් නවයයි ශත හැත්තෑ තුන (රු. 139.73) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, වාද්දුව, උතුර තල්පිටිය, මැද පාර, අංක 40හි බලයලත් වෙන්දේසිකාර ඩී. පී. එල්. සී. ද සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කලුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ පානදුර තල්පිටි දෙබැද්ද පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ කෙසෙල්වත්ත පිහිටි රුක්අත්තනගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එම්. ඩී. කුරේ විසින් මැන සකසන ලද 2007.01.04 දිනැති අංක 2013 දරන පිඹුරේ කැබලි අංක බී ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 8.60ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස වේ.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක එෆ් 567/95 යටතේ ලියාපදිංචි වී ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 සැප්තැම්බර් මස 23 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

10-341/3

---

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. හල්ඇල්ල විසින් සහතික කරන ලද 2006.03.17 දින හා අංක 704 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, පිළියන්දල පදිංචි කන්දෙ අප්පුලාගේ ධර්මදාස හෙවත් කන්දගේ අප්පුහාමිලාගේ ධර්මදාස සහ කන්දෙ අප්පුලාගේ ධම්මික ප්‍රසන්න යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.04.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ හැට අටදහස් පන්සිය විසිත් එකයි ශත හැත්තෑහතරක (රු. 3,68,521.74) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 704 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය පනස් නවයයි ශත එක (රු. 159.01) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලෙපත්තුවේ, සල්පිටි කෝරළයේ, කැස්බෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තුම්බෝවිල ග්‍රාමයේ පිහිටි කරදියානවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ආර්. එස්. පෙරේරා විසින් සකසන ලද 2001.02.22 දින හා අංක 730 දරන මිණුම් පිඹුරෙහි කැබලි අංක 7ඒ ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 12.26ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස හා ඒ මත පිහිටි ගහකොළ ඇතුලු සියලු දේත් සමග වේ.

මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක එම් 2933/182 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 සැප්තැම්බර් මස 23 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

10-341/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 1/48171/සීඩී9/404.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.09 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 2/72863/සී2/786, 2/73980/කේ2/236.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2010.06.09 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

උඟරාපොල සහ ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. වී. පී. නිරංජන් සහ ආර් එම්. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද 2002.01.01 සහ 2002.11.15 දින හා අංක 1019 සහ 20600 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, නිට්ටඹුව පදිංචි පිලපිටිය ගෙදර දිසානායක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.04.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හැටහත් දහස් හාරසිය තිස් තුනයි ශත අසූ එකක් (රු. 67,433.81) සහ එක්ලක්ෂ පනස් හතර දහස් පන්සිය හතලිස් හයයි ශත පනස් පහක (රු. 1,54,546.55) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1019 සහ 20600 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් තිස් හතයි ශත අසූ හතක් (රු. 37.87) සහ රුපියල් අසූ හතරයි ශත හැට අට (රු. 84.68) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මීගමුව, ප්‍රනාන්දු මාවත, අංක 22හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

## උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, උඩුගහපත්තුවේ, සියනෑ කෝරළයේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පනාවල පිහිටි කෝන්ගහලන්ද හෙවත් කරගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් සකසන ලද 2000.08.05 දිනැති හා අංක 297ආර්/2000 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 8 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 15ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස හා ඒ මත පිහිටි ගොඩනැගිල්ල ඇතුලු සියලු දේත් සමග වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 231/208 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද එකී අංක 297 ආර්/2000 පිඹුරේ වෙන්කළ පාර සඳහා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්. එම්. දයාසිංහ,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 සැප්තැම්බර් මස 23 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

10-341/1

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 362113.
සුජීව පුෂ්ප කුමාර සමරසිංහ.

2009 ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී:-

තිස්සමහාරාම ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. ජී. ආනන්ද විසින් 2007 අප්‍රේල් මස 25 වැනි දින සහතික කරන ලද අංක 1014 සහ 2007 සැප්තැම්බර් මස 17 වැනි දින සහතික කරන ලද අංක 1130 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සුජීව පුෂ්ප කුමාර සමරසිංහ ණයකරුවන් හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පසලොස් ලක්ෂ දහතුන් දහස් හයසිය හැටහතයි ශත අසූ පහක (රු. 15,13,667.85) මුදලක් 2009 සැප්තැම්බර් මස 14 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පහලොස් ලක්ෂ දහතුන් දහස් හයසිය හැට හතයි ශත අසූ පහක (රු. 15,13,667.85) මුදල අයකර ගැනීම සඳහා 2009 සැප්තැම්බර් මස 14 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 14,16,745.67ක මුදල මත 20%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් ද දරන ලද වෙනත් වියදම් ද මෙතෙක් ලබා ගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 1014 සහ 1130 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ අංක 99හි බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

## උපලේඛනය

බලයලත් මානක එච්. පී. පී. ජයවර්ධන විසින් 1999 ඔක්තෝබර් මස 17 වැනි දින සාදන ලද අංක 6868 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම්පත්තුවේ තිස්සමහාරාම කොට්ඨාසයේ, තිස්සමහාරාම ග්‍රාමයේ පිහිටි කච්චේරියගම කියන ඉඩමේ බිම් පස, ගොඩනැගිලි සහ එහි මතුපිට පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 5 දරන කොටසට මායිම්, උතුරට : පිඹුරු පත් අංක 6868හි ලොට් 4 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : පිඹුරුපත් අංක 6868හි ලොට් 6 ද, බටහිරට : එම ඉඩමට අයත් ලොට් 4 ද යන මායිම් තුළ පර්චස් දොළහයි දශම දෙකයි පහක් (අ. 0. රූ. 0, පර්. 12.25) විශාල ඉඩම හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C71/13 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

මැතක දී සාදන ලද පිඹුරු පතක ඉහත කී ඉඩම මෙලෙස විස්තර කර ඇත :-

බලයලත් මානක සී. එස්. ජයවර්ධන විසින් 1999 ඔක්තෝබර් මස 17 වැනි දින සාදන අංක 6868 දරන පිඹුරෙහි ලොට් 5 සේ දැක්වෙන බලයලත් මානක ඩබ්ලියු. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් 2007 පෙබරවාරි මස 22 වැනි දින සාදන ලද අංක 3819 දරන පිඹුර දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම්පත්තුවේ, තිස්සමහාරාමයේ දිසා ලේකම් කාර්යාලය සීමාවන් තුළ තිස්සමහාරාම ග්‍රාමයේ පිහිටි කච්චේරියගම නමැති ඉඩමේ බිම් පස, ගොඩනැගිලි සහ එහි මතුපිට පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් A දරන කොටසට මායිම්, උතුරට : පිඹුරු පත් අංක 6868හි ලොට් 4 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : පිඹුරුපත් අංක 6868හි ලොට් 6 ද, බටහිරට : එම ඉඩමේම ලොට් 4 ද යන

මායිම් තුළ පර්චස් දොළහයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 12.25) හෙවත් හෙක්ටායර් 0.03098 විශාල ඉඩම.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

10-368

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 450613
සුජීව පුෂ්ප කුමාර සමරසිංහ, උදය කුමාර සමරසිංහ

2009 නොවැම්බර් මස 27 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී:-

තිස්සමහාරාම ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. ජී. ආනන්ද විසින් 2007 අප්‍රේල් මස 25 වැනි දින සහතික කරන ලද අංක 1012 සහ 2007 සැප්තැම්බර් මස 17 වැනි දින සහතික කරන ලද අංක 1128 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සුජීව පුෂ්ප කුමාර සමරසිංහ සහ උදය කුමාර සමරසිංහ ණයකරුවන්/උකස්කරුවන් හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තිස් අට ලක්ෂ පන්සිය දාහහතයි ශත විස්සක (රු. 38,00,517.20) මුදලක් 2009 සැප්තැම්බර් මස 14 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් තිස් අට ලක්ෂ පන්සිය දහහතයි ශත විස්සක (රු. 38,00,517.20) මුදල අයකර ගැනීම සඳහා 2009 සැප්තැම්බර් මස 15 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 30,09,000ක මුදල මත 22%ක වැඩිදුර වාර්ෂික පොළිය ද සමග ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් ද දැරීමට සිදුවූ වෙනත් ගාස්තු සහ මෙතෙක් ලබා ගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 1012 සහ 1128 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ අංක 99හි බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බලයලත් මානක එච්. පී. පී. ජයවර්ධන විසින් 1982 ජූලි මස 10 වැනි දින සාදන ලද අංක 326 දරන පිඹුරෙහි දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, තිස්සමහාරාම දිසා ලෙක්ම් කොට්ඨාසයේ රණකෙළිය උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ රණකෙලිය උතුර ග්‍රාමයේ පිහිටි සඳගිරිගොඩ කියන ඉඩමත් එහි පිහිටි බිම් පස, ගොඩනැගිලි, වගාවන් සහ එහි මතුපිට පවත්නා අනෙකුත් සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 4 ලෙස සලකුණු කර ඇති කොටසට මායිම්, උතුරට : එම ඉඩමටම අයත් ලොට් 3 ද, නැගෙනහිරට : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම හිමිකම් කියන සඳගිරිගොඩ කුඹුරේ කොටසක් ද, දකුණට : එම ඉඩමට අයත් ලොට් 5 ද සහ බටහිරට : පාර ද යන මායිම් තුළ පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C21/107 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

මෑතක දී සකස් කරන ලද පිඹුරු පතක් ඉහත ඉඩම මෙලෙස විස්තර කර ඇත :-

බලයලත් මානක ජී. ඩී. යූ. කරුණාරත්න විසින් 2007 මාර්තු මස 17 වැනි දින සාදන ලද අංක 3824 පිඹුර පරිදි දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම්පත්තුවේ තිස්සමහාරාම දිසා ලේකම් කාර්යාලීය සීමාවන් තුල රණකෙළිය (F. V. P. 630) උතුර ග්‍රාමයේ පිහිටි බලයලත් මානක එච්. පී. පී. ජයවර්ධන විසින් 1982 ජූලි මස 10 වැනි දින සාදන ලද අංක 326 දරන පිඹුරෙහි ලොට් 4 ලෙස දැක්වෙන සඳගිරිගොඩ කියන ඉඩමේ කොටසක් යැයි කියන එහි ඇති බිම් පස, ගොඩනැගිලි සහ එහි මතු පිට පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් A දරන කොටසට මායිම්, උතුරට : එම්. ජී. සුමනලතා හිමකම් කියන එම ඉඩමට අයත් ලොට් 3 ද, නැගෙනහිරට : කේ. කේ. සාලිය උදය කුමාර හිමිකම් කියන ඉඩම ද, දකුණට : කේ. එල්. තිලක් හිමිකම් කියන එම ඉඩමේම ලොට් 5 ද, බටහිරට : පාර ද යන මායිම් තුළ පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) නොහොත් හෙක්ටයාර් 0.0380 විශාල ඉඩම.

ආර්. ආර්. දුනුවිල මිය.,
සමාගම් ලේකම්.

10-369

---

### ලංකා බැංකුව - නුවරඑළිය ශාඛාව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.08.19 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගමගේ මයා විසින් සහතික කරන ලද 2007.07.11 දිනැති අංක 1976 දරන උකස්කරය මත මුල් මුදල් හා 2010.06.21 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් හයලක්ෂ හැත්තෑ අටදහස් හත්සිය තුනයි ශත හතලිස් නමයක (රු. 6,78,703.49) මුදල සමග රුපියල් හාරලක්ෂ හතලිස් නව දහස් හාරසිය හැට හයයි ශත තිස් පහක (රු. 4,49,466.35) මුදල මත 2010.06.22 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට දහහතරක (14%) වාර්ෂික පොළියක් ද, නුවරඑළිය, ඉහල ලේක් පාර, බෘම්ෆීල්ඩ් මාවත, අංක 21/2 දරන ස්ථානයේ පදිංචි විජේතුංග මුදියන්සේලාගේ මංජුල විජේතුංග මහතාගෙන් ලංකා බැංකුවට අයවිය යුතුව ඇත.

2. ඉහත කී 2007.07.11 දිනැති අංක 1976 දරන බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් හයලක්ෂ හැත්තෑ අටදහස් හත්සිය තුනයි ශත හතලිස් නමයක (රු. 6,78,703.49) මුදල සමග 2010.06.22 වැනි දින සිට

විකිණීම කරන දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය කොට්ඨාසයේ, ඔය පළාත කෝරලේ, නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ, නුවරඑළිය බෲම්ෆීල්ඩ් මාවතේ පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. කනගරත්නම් මහතා විසින් සාදන ලද 1993.12.12 දිනැති අංක 6046 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති, වරිපනම් අංක 21/2 දරන "මල්ඔය" යනුවෙන් හඳුන්වනු ලබන ගොඩනැගිල්ල සමග වූ ඉහත කී අංක 6046 දරන පිඹුරේ මිනුම් විස්තර අනුව, උතුර හා ඊසාන දෙසට : කැබලි ඉසට් ද, නැගෙනහිරට : අංක 10/75 දරන පිඹුරේ කැබලි 2හි කොටසක් වන, කැබලි වයි ද, ගිනිකොණ දෙසට : අංක 10/75 දරන පිඹුරේ කැබලි 2හි කොටසක් වන කැබලි 1ඒ ද, නිරිත දෙසට : ප්‍රයරි ගෙස්ට් හවුස් ස්ථානයේ කොටසක් වන කැබලි X ද, වයඹ දෙසට : වරිපනම් අංක 21 දරන ඩිල්කූෂ් ස්ථානය ද මායිම් වූ පර්චස් දහයයි දශම අටක (අ. 0, රූ. 0, පර්. 10.8) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද නිරූපිත සියලු ඉඩම් කට්ටිය ද එහි තුළ පිහිටා ඇති නිවාස ගොඩනැගිලි, ගස් හා සෑම සියලු දේත් අංක 10/75 දරන පිඹුරේ අංක 3 කැබැල්ල, අංක 4/1950 දරන පිඹුරේ කැබලි 2, 3 හා 4, අංක ඒ/78 දරන පිඹුරේ කැබලි 5 හා අංක 3803 දරන පිඹුරේ "කේ" යනුවෙන් පෙන්නුම් කර ඇති කැබල්ල මත වූ පාර අයිතිය ද වේ. මෙය නුවරඑළිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 64/232, ඒ 68/253, 281, ඒ47/220 හා ඒ 56/245 පිටුවල ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,

කේ. ඒ. ධර්මරත්න මයා.,  
ජ්‍යෝෂ්ඨ කළමනාකරු,  
ලංකා බැංකුව - නුවරඑළිය ශාඛාව.

10-405

---

දරන උකස්කරය මත රුපියල් හය ලක්ෂ අසූ හත් දහස් පන්සියයක (රු. 6,87,500) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව ඇත. එබැවින්, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් හය ලක්ෂ අසූ හත් දහස් පන්සියයක (රු. 6,87,500) ක මුදල 2009.04.01 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් හයලක්ෂ අසූහත් දහස් පන්සීයයක (රු. 6,87,500)ක මුදල මත වර්ෂයකට සියයට විසි හයක් (26%) බැගින් පොළිය ද, විකිණීමේ ගාස්තු ද එකී මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද, එදින තෙක් අය කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේනම්) අඩු කිරීමෙන් පසු අය කර ගැනීම සඳහා අංක 3518 දරන උකස්කරය මගින් උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### දේපළ හා පරිශ්‍ර පිළිබඳ විස්තර

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, උතුරු ගිරුවා පත්තුවේ මුරුංගගස්යාය ගමේ පිහිටි කැටකාල ගහ කොරටුව නමැති හි. පී. 412987 හි සඳහන් කැබලි අංක 144 ඒඑක්ස් දරන ඉඩම වෙනුවෙන් අවසර ලත් මිනින්දෝරු කේ. ඩබ්. එස්. කේ. වික්නරාජා මහතා විසින් 2008.03.03 මැන සකස් කරන ලද අංක 693 දරන පිඹුරෙහි ඒ අක්ෂරය දරන කැබැල්ල ලෙස සඳහන් උතුරට : හි. පි. 399173 හි සඳහන් ඉඩම, නැගෙනහිරට : අ. ග. පි. 401හි කැබලි අංක 64, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස, බස්නාහිරට : ප්‍රධාන පාරේ සිට නිවස දක්වා දිවෙන පාර මායිම් තුළ පිහිටි, අක්කර එකයි රූඩ් එකයි පර්චස් දෙකයි (අ. 01, රූ. 01, පර්. 02) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි, ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ඇතුළු අන් සියලු දේ ද වේ. මෙය තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 259/67 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර ප්‍රාදේශීය කළමනාකරු,  
හම්බන්තොට.

මහජන බැංකුව,  
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,  
අංක 07 ඒ, ටවර්හිල් මාවත,  
හම්බන්තොට.

10-307

---

## මහජන බැංකුව - මිද්දෙනිය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 දරන අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

මහජන බැංකුවේ නමට තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. ඩී. කුමුදිනී මහත්මිය විසින් සහතික කරන ලද අංක 3518 හා 2009.04.01 දින දරන උකස්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම වීරක්කොඩි ආරච්චිගේ ආරියසේන සහ වීරක්කොඩි ආරච්චිගේ හරිස්චන්ද්‍ර පුෂ්පකුමාර යන අය විසින් පැහැර හැර ඇති බැවින්, එකී අංක 3518

---

## මහජන බැංකුව - හොරණ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී(29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2009.08.28 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් මේරියන් සන්ධ්‍යා ද සිල්වා විසින් සහතික කරන ලද 2005.09.21 දිනැති අංක 1097 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් තිලකරත්න ආරච්චිගේ පද්මසේන තිලකරත්න මහතා අමරසිංහ ආරච්චිගේ පුෂ්පා කාන්ති මහත්මිය යන අය විසින් පැහැර හැර ඇති

බැවින් ද, එකී උකස්කරයන් යටතේ දැනට රුපියල් දෙලක්‍ෂ පනස් නව දහස් හතලිස් පහයි ශත අනූ දෙකක (රු. 2,59,045.92) මුදලක් මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින්ද 2007.02.28 දින සිට වර්ෂයකට 16.75% බැගින් මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොලිය ද ගාස්තු සමඟ අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු ගාස්තු සහ මුදල්ද, අනතුරුව කිසියම් ගෙවීමක් ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්‍ෂ පනස් නව දහස් හතලිස් පහයි ශත අනූ දෙකයි (රු. 2,59,045.92) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර සමන්මලි රාමනායක විසින් එකී අංක 1097 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ (29D) වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරලේ කුඹුකේ පත්තුවේ පලන්නොරුව යන ගම පිහිටි "බෙලිගස් වත්තේ කට්ටිය" කියන ඉඩමට අවසරලත් මානක සිරිල් වික්‍රමගේ මහතා විසින් 1994.04.23 වැනි දින මැන සාදන ලද අංක 1656 දරන පිඹුරේ කැබලි අංක 4ජී දරන ඉඩමට මායිම්, උතුරට : මෙම පිඹුරේ කැබලි අංක 4ඊ සහ 4එෆ් ද, නැගෙනහිරට : ඩී. සී. ජයකොඩි සහ තවත් අයට අයිති ඉඩම ද, දකුණට : නගර සභා පාර ද, බස්නාහිරට : ලොට් 4ඩී දරන කොටස ද යන මායිම් තුල පිහිටි පර්චස් දහසයයි දශම පහයිපහක් (අ. 00, රූ. 0, පර්. 16.55) විශාල ඉඩම සහ එහි තුල පිහිටි සියලුම ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලුම දේද වේ.

ඉහත සඳහන් ඉඩම හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 149/68 දරන පත්‍රිරුවේ පහත සඳහන් පරිදි ලියාපදිංචි වී ඇත.

ඉහත කී මහවත්ත නමැති ග්‍රාමයේ පිහිටි බෙලිගස්වත්ත නමැති ඉඩමේ කැබලි අංක 4ජී දරන කොටසට මායිම්, උතුරට : 1656 දරන පිඹුරේ අංක 4ඊ සහ 4 එෆ් ද, නැගෙනහිරට : ඩී. සී. ජයකොඩි සහ තවත් අයට අයිති ඉඩම ද, දකුණට : නගර සභා පාර ද, බස්නාහිරට : ලොට් 4ඩී දරන කොටස ද, යන මායිම් තුල පිහිටි පර්චස් දහසයයි දශම පහයිපහ (අ. 0, රූ. 0 පර්. 16.55) ක් විශාල ඉඩම සහ එහි තුල පිහිටි සියලුම ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලුම දේද වේ.

පහත සඳහන් මාර්ග අයිතීන්ද සමඟ වේ.

01. ඉහත කී පලන්නෝරුව ගමේ පිහිටි බෙලිගස්වත්තේ කට්ටිය කියන ඉඩමට මැන සෑදූ පෙර කී අංක 2966 සහ 1972.12.15 දිනැති සිතියමේ ප්‍රකාර අංක 6 දරන ඉඩම් කැබැල්ලට මායිම්.

    උතුරු-නැගෙනහිරට : මෙම ඉඩමේම අංක 4 දරන කැබැල්ල ද, දකුණට : මෙම ඉඩමේ අංක 4 දරන කැබැල්ල සහ අඩි පාරක් සඳහා වෙන්කළ අංක 5 දරන කැබැල්ල ද, බස්නාහිරට : මෙම ඉඩමේම අංක 1 දරන කැබැල්ල ද, යන මෙකී මායිම් තුල පර්චස් එකයි දශම හතයි පහක් (අක්. 0, රූ. 0, පර්. 1.75) ක් විශාල බිම් කැබැල්ල සහ එහි පිහිටි ළිඳ ද පොදුවේ පාවිච්චි කිරීමේ අයිතිය ද සමග වේ.

    හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී/157-103 දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇති.

02. ඉහත කී පලන්නෝරුව ගමේ පිහිටි බෙලිගස්වත්තේ කට්ටිය කියන ඉඩමට මැන සෑදූ පෙරකී අංක 1656 සහ 1994.04.22 දිනැති සිතියමේ ප්‍රකාර අංක 4ඩී දරන ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට: අංක 1656 දරන පිඹුරේ අංක 4බී දරන කැබැල්ල සහ අංක 2966 දරන පිඹුරේ අංක 6 දරන කැබැල්ල ද, නැගෙනහිරට : අංක 1656 දරන පිඹුරේ අංක 4ජ්4 සහ අංක 4ඊ සහ අංක 4ජී දරන කැබලි ද, දකුණට : එකී සිතියමේ අංක 4 සහ අංක 4ඊ දරන කැබලි ද සහ පාර ද, බස්නාහිරට : පෙර කී අංක 2966 පිඹුරේ අංක 5 දරන පාරක් සඳහා වෙන් කළ බිම් තීරය ද, යන මෙකී මායිම් තුල පර්චස් දොලහයි දශම හතරයි පහක් (අක්. 0, රූ. 0, පර්. 12.45) හෙවත් හෙක්ටයාර් 0.0315 ක් විශාල කම ඇති මීටර් 4.5ක් පළල ඇති බෙදූ බිම් තීරය ද,

03. ඉහත කී පලන්නෝරුව ගමේ පිහිටි බෙලිගස්වත්තේ කට්ටිය කියන ඉඩමට මැන සෑදූ පෙරකී අංක 2966 හා 1972.12.15 දිනැති සිතියමේ ප්‍රකාර අංක 5 දරන ඉඩම් කැබැල්ලට මායිම්.

උතුර-නැගෙනහිරට : අංක 6 දරන මෙම ඉඩමේ කැබැල්ල ද, දකුණු නැගෙනහිරට-දකුණු-බස්නාහිරට : අංක 4 දරන කැබැල්ල සහ කරත්ත පාර ද, උතුරු-බස්නාහිරට : මෙම ඉඩමේම අංක 3 සහ අංක 01 දරන කැබැලි ද, යන මෙකී මායිම් තුළ පර්චස් දෙකයි දශම දෙකයි පහක් (අක්. 0, රූ. 0, පර්. 2.25) විශාල කම ඇති අඩි හතර (අඩි 4) ක් පළල බෙදූ බිම් තීරයද යන මෙකී බිම් තීරයන් දෙකම (පෙරකී අංක 4ඩී සහ අංක 5 දරන කැබලි) පයින් හෝ වාහනයකින් ගමන් කිරීමේ අයිතියද සමඟ අනෙකුත් සියලු පරවශ්‍යතා අයිතියද සමඟ යන බිම් කැබැල්ල සහ එහි පිහිටි ළිඳ ද පොදුවේ පාවිච්චි කිරීමේ අයිතිය ද සහිතව පොදුවේ පාරවල් වශයෙන් පාවිච්චි කිරීමේ මාර්ග අයිතීන් ද යන මෙකී දේපළ වේ.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
(කළුතර).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර)
341, ගාළු පාර,
පානදුර.

10-309

---

### මහජන බැංකුව - හොරණ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2009.08.28 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් මේරියන් සන්ධ්‍යා ද සිල්වා මහත්මිය විසින් සහතික කරන ලද 2006.03.23 දිනැති අංක 1379 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, (1) දොන් දන්දිරිස් හෙට්ටිආරච්චි (2) නිහාල් රංජිත් හෙට්ටිආරච්චි (3) හෙට්ටිආරච්චිගේ දොන් ගුණරත්න යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දස ලක්‍ෂ දහ අට දහස් දෙසිය හැට නවයයි ශත දොලහක (රු. 10,18,269.12) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද, 2009.02.10 දින සිට වර්ෂයට 22.5% බැගින් රුපියල් දස ලක්‍ෂ දහ අට දහස් දෙසිය හැට නවයයි ශත දොලහක (රු. 10,18,269.12) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාල මහජන බැංකු පනතේ

29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දස ලක්ෂ දහ අට දහස් දෙසිය හැට නවයයි ශත දොලහක (රු. 10,18,269.12) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ඊ. සමන්මලි රාමනායක විසින් එකී අංක 1379 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තර

හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී. 75/287 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇති බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ හොරණ පිහිටි හොරණ නගර සභා සීමාව තුල ශ්‍රී සෝමානන්ද පාරේ වරිපනම් අංක 83 දරන "අම්බලමේ හේන" නමැති ඉඩමේ ලොට් 03 දරන ඉඩම් කැබැල්ලට අවසරලත් මානක ඩබ්. අහංගම මහතා විසින් 1968.12.03 වැනි දින මැන සාදන ලද අංක 1201 දරන පිඹුරේ පෙන්වා දෙන පරිදි මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 02 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 04 ද, දකුණට : සෝමානන්ද පාර ද, බස්නාහිරට : ජී. විජේමාන්නට අයත් ඉඩම ද, යන මායිම් තුල පිහිටි රූඩ් එකක් (අක්. 0, රූ. 01, පර්. 0) විශාල ඉඩම සහ ඒ තුල පිහිටි සියලුම ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලුම දේද වේ.

හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී. 75/254 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇති ඉහත කී, හොරණ පිහිටි හොරණ නගර සභා සීමාව තුළ ශ්‍රී සෝමානන්ද පාරේ වරිපනම් අංක 83 දරන "අම්බලමේ හේන" නමැති ඉඩමේ ලොට් 04 නමැති (පාරක් සඳහා වෙන් කර ඇති) දරන ඉඩම් කැබැල්ලට අවසරලත් මානක ඩබ්. අහංගම මහතා විසින් 1968.12.03 වැනි දින මැන සාදන ලද අංක 1201 දරන පිඹුරේ පෙන්වා දෙන පරිදි මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 01 ද, නැගෙනහිරට : ප්‍රැන්සිස් විජේමාන්නට අයත් ඉඩම ද, දකුණට : සෝමානන්ද පාර ද, බස්නාහිරටඃ මෙම ඉඩමේ ලොට් අංක 03 සහ 02 ද, යන මායිම් තුල පිහිටි පර්චස් දහයක් (අක්. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම පාරක් වශයෙන් පාවිච්චි කිරීමේ පරවශ්‍යතා අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
(කළුතර).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර)
අංක 341, ගාලුපාර,
පානදුර.

10-310

---

### මහජන බැංකුව - කැබිතිගොල්ලෑව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් සෙනෙවිරත්න මුදියන්සේලාගේ දීපදූ කුමාරි මහත්මිය විසින් සහතික කරන ලද 2009.05.28 දිනැති අංක 4156 සහ 4157 දරන උකස්කර ප්‍රකාර පිළිවෙලින් කැබිතිගොල්ලෑව, පදවිය පාර, විමල් ස්ටෝර්ස් සහ අනුරාධපුර, වන්නියන්කුලම, නාගසේන මාවත, 1036/259හි පදිංචි වික්‍රම ආරච්චිලාගේ සුනිල් නිශාන්ත සහ අනෝමා ප්‍රියදර්ශනී වීරතුංග යන අය විසින් ගෙවීම් පැහැර හැර බැවින් ද, එකී උකස්කර යටතේ පිළිවෙලින් රුපියල් අටලක්ෂ අසූතුන්දහස් තුන්සිය තිස් එක (රු. 8,83,331) මුදලක් හා රුපියල් හාරලක්ෂ හැටතුන්දහස් දහතුනයි ශත පනස් අටක (රු. 4,63,013.58) දැනට මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින්ද, පිළිවෙලින් 2010.05.25 දින සිට වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් අටලක්ෂ අසූතුන්දහස් තුන්සිය තිස් එක (රු. 8,83,331) මුදලක් හා 2010.05.25 දින සිට වර්ෂයකට සියයට විසි දෙක (22%) බැගින් රුපියල් හාරලක්ෂ හැටතුන්දහස් දහතුනයි ශත පනස් අටක (රු. 4,63,013.58) මුදලක් සඳහා වෙන්දේසි දින දක්වා තවදුරටත් පොලිය සහ වෙන්දේසි ගාස්තු ඇතුලුව වෙනත් ගාස්තු ඇත්නම් ඒවා ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් අටලක්ෂ අසූතුන් දහස් තුන්සිය තිස් එක (රු. 8,83,331) ක මුදලක් හා රුපියල් හාරලක්ෂ හැටතුන් දහස් දහතුනයි ශත පනස් අට (රු. 4,63,013.58) ක් අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 4156 සහ 4157 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තර

උතුරු මැද පළාතේ, අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාතේ කනදරා කෝරළේ, අංක 246 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වන්නියන්කුලම නමැති ගමේ පිහිටා ඇත්තාවූ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 21 දරන ක්ෂෙත්‍ර පත්‍රයෙහි රේඛා සටහනේ අංක 1133 වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ රජයේ ගොඩ ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : අ. ග. පි. 259හි කැබලි අංක 1132 ද, නැගෙනහිරට : අ. ග. පි. 259 හි නාගසේන මාවත ද, දකුණට : අ. ග. පි. 259හි කැබලි අංක 1134 ද, බස්නාහිරට : අ. ග. පි. 259හි කැබලි අංක 1135 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි හතයි තුන (හෙක්ටයාර් 0.173)ක් විශාල ඉඩම් සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේත් සමග මාර්ග අයිතියද වේ.

ඉහත කී දේපළ සඳහා බලයලත් මිනින්දෝරු, ලියනගේ සිරිපාල මහතා විසින් 2001.03.11 වැනි දින නැවත මැන සාදන ලද අංක 997 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක 03 දරන කොටසට නව මායිම්, උතුරටඃ මෙම පිඹුරේ කැබලි අංක 02 ද, නැගෙනහිරට : අ. ග. පි. 259හි නාගසේන මාවතද, දකුණට : අ. ග. පි. 259හි කැබලි අංක 1134 ද, බස්නාහිරට : අ. ග. පි. 259හි කැබලි අංක 1135 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි පහයි බිංදුවයි අට (හෙක්ටයාර් 0.0508)ක්, විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ සහ පළතුරු ආදී සෑම සියලු දේත් සමග මාර්ග අයිතිය ද වේ.

ඉහත කී දේපළ සඳහා නැවතත් බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ මහතා විසින් 2008.12.14 වැනි දින මැන සාදන ලද අංක 2008/ඒඑන්/293 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක 04 දරන කොටසට නව මායිම්, උතුරට : අංක 997 දරන පිඹුරෙහි කැබලි අංක 02 ද, නැගෙනහිරටඃ එෆ්. වී. පී. 259හි කැබලි අංක 1163 ද, දකුණට : එෆ්. වී. පී. 259හි කැබලි අංක 1134 ද, බස්නාහිරට : එෆ්. වී. පී. 259 හි කැබලි අංක 1135ද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් දශම බින්දුවයි පහයි බින්දුවයි අට (හෙක්. 0.0508)ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග මාර්ග අයිතිය ද වේ.

මෙම දේපළ අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙහි අංක. එල්. ඩී. ඕ. 229/64, 608/172 සහ 608/180 දරන පත්‍රිරුවල ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

කලාපීය සහකාර සාමාන්‍යාධිකාරී,
(උතුරුමැද කලාපය).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අනුරාධපුර.

10-312

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : ජීපී/02/03414/එක්ස්2/135.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.24 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. ඩබ්. උණසේකර විසින් සහතික කරන ලද 2006.07.31 දින හා අංක 2641 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ආඬිඅම්බලම පදිංචි වඩුතන්ත්‍රිගේ සුජීටා නිරෝෂණී ප්‍රනාන්දු හෙවත් වඩුතන්ත්‍රිගේ සුජීවා නිරෝෂනී ප්‍රනාන්දු සහ මනෝජ් ප්‍රසන්න බණ්ඩාර සේනාධීර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.03.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හත්ලක්ෂ තිස් අටදහස් හත්සිය දහයයි ශත අනූහය (රු. 7,38,710.96)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2641 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් තුන්සිය හැට නවයයි ශත තිස්හය (රු. 369.36) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, බෙල්මන්ට් වීදිය, 2 වැනි මහල, අංක 53හි බලයලත් වෙන්දේසිකාර කේ. පී. එන්. සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ අලුත්කුරු කෝරළයේ, දාසියාපත්තුවේ, ආඬිඅම්බලම පිහිටි කහටගහවත්ත කහටගහලන්ද, ඇහැටුගහලන්ද හෙවත් ඇහැටුගහවතු පංගුව, සහ ඇහැටුගහවත්ත නමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සකසන ලද 1995.10.21 දිනැති හා අංක 2979 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 2 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 35.75ක් වූ බෙදා වෙන්කළ බිම් කොටස හා ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 783/239 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
වැඩබලන සාමාන්‍යාධිකාරී.

2010 සැප්තැම්බර් මස 23 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

10-341/6